නගෝයා නගරයේ ජාතික සෞඛ්‍ය රක්ෂණය සඳහා වන අත් පොත (සාරාංශ අනුවාදය)

1 ජාතික සෞඛ්‍ය රක්‍ෂණයට ඇතුළත් වීම

(1) ජාතික සෞඛ්‍ය රක්ෂණය යනු කුමක්ද?

ජපානයේ වෙසෙන පුද්ගලයන් තම පුරවැසිභාවය කුමක් වුවද, යම් ආකාරයක පොදු වෛද්‍ය රක්ෂණයකට ඇතුලත් වේ. රක්ෂණයට ඇතුලත් වන සියලුම සාමාජිකයින් අතර වාරික බරපැණ දැරීමක් සිදුවන අතර, තමා විසින් රෝහලට ගෙවනු ලබන මුදල වන්නේ වෛද්‍ය ගාස්තුවෙන් 30%ක් පමණි.

(2) ජාතික සෞඛ්‍ය රක්‍ෂණයට ඇතුළත් වීම

සාමාන්‍ය රීතියක් ලෙස, මාස 3 කට වඩා වැඩි කාලයක් නේවාසිකව පදිංචිව සිටින විදේශිකයින් ජාතික සෞඛ්‍ය රක්‍ෂණයට ඇතුළත් වේ. රක්ෂණයට ඇතුලත් වීම ස්වේච්ඡාවෙන් සිදු වීමක් නොව, **අනිවාර්යය වේ**. මෙය ජපන් නීතිය මගින් තීරණය කර තිබේ.

(3) ජාතික සෞඛ්‍ය රක්‍ෂණය සඳහා ඇතුලත් වීමේ ක්‍රියා පටිපාටිය දින 14 ක් ඇතුලත



තමා නගෝයා නගරයට පදිංචියට පැමිණි දින සිට **දින 14 ක් ඇතුළත** තම පදිංචි කොට්ඨාශ කාර්යාලයේ සෞඛ්‍ය රක්‍ෂණ සහ විශ්‍රාම වැටුප් අංශයෙන් හෝ ශාඛා කාර්යාලයේ පුරවැසි සුබසාධන අංශයෙන් ඇතුලත් වීමේ ක්‍රියා පටි පාටිය සිදු කළ යුතුය.

◆ ක්‍රියා පටිපාටිය ප්‍රමාද වුව හොත්...

- සෞඛ්‍ය රක්ෂණ සුදුසුකම් සහතිකය භාවිතා කළ හැක්කේ ක්‍රියා පටිපාටිය සිදු වූ දින සිට පමණි.
- තමා නගෝයා නගරයේ පදිංචියට පැමිණි අදාල මාසය දක්වා වන රක්ෂණ වාරික ගෙවිය යුතුය.

2 සෞඛ්‍ය රක්ෂණ සුදුසුකම් සහතිකය භාවිතා කරන ආකාරය

- තමා රෝහලක වෛද්‍ය ප්‍රතිකාර කාර්ය පිණිස පැමිනෙන විට තමාගේ රක්ෂණ කාඩ්පත පෙන්වන්න. තම සෞඛ්‍ය රක්ෂණ සුදුසුකම් සහතිකය පෙන්වීමෙන් තමා විසින් රෝහලට ගෙවනු ලබන මුදල වන්නේ වෛද්‍ය ගාස්තුවෙන් 30% ක් පමණි.
- තමාගේ සෞඛ්‍ය රක්ෂණ සුදුසුකම් සහතිකය වෙනත් පුද්ගලයෙකුට ලබා දීම හෝ ලබා ගැනීම, නීතියෙන් දඬුවම් ලැබෙන වරදක් වනු ඇත.
- තම පදිංචි කොට්ඨාශ කාර්යාලයෙන් (ශාඛා කාර්යාලය) තම සෞඛ්‍ය රක්ෂණ සුදුසුකම් සහතිකය ලබා ගන්න.
- වෛද්‍ය ගාස්තු අධික වීමට ඉඩ තිබේ නම්, තම පදිංචි කොට්ඨාශ කාර්යාලයෙන් (ශාඛා කාර්යාලයෙන්) උපරිම ගාස්තු සීමා සහතිකය ලබාගෙන එය සෞඛ්‍ය රක්ෂණ සුදුසුකම් සහතිකය සමඟ රෝහලට ඉදිරිපත් කිරීමෙන්, වෛද්‍ය ගාස්තු ගෙවීමේ බර පැන අඩු කර ගත හැක.



*ප්‍රමාණය අවම කිරීමේ උපරිම ගාස්තු සීමා සහතිකය, රක්ෂණ වාරික ගෙවීම් හිඟ වී ඇති නම් භාවිතා කළ නොහැක.

3 ජාතික සෞඛ්‍ය රක්ෂණ වාරික ගණනය කිරීම

(1) රක්ෂණ වාරික ගණනය කිරීම/තීරණය කිරීම

- රක්ෂණ වාරික සෑදී ඇත්තේ ඒක පුද්ගල මූල්‍ය පදනම (රක්ෂණයට ඇතුලත් වන පුද්ගල සංඛ්‍යාව අනුව අනුචිත කොටස) සහ ආදායම් මත පදනම් වූ මූල්‍ය පදනම (ආදායම අනුව අනුචිත කොටස) යනුවෙන් සමන්විත වේ.
- රක්ෂණ වාරික සෑම වසරකම ජුනි මාසයේදී තීරණය කරනු ලබන අතර ගෙවීම් කිරීම දැනුම් දීමකින් ප්‍රකාශයට පත් කෙරේ.

*සාමාන්‍ය රීතියක් ලෙස, තමා ජාතික සෞඛ්‍ය රක්‍ෂණයට ඇතුලත් වුනු මූල්‍ය වර්ෂය සඳහා වන වාරික මුදල, තමන් අයදුම් කල මසට පසු දන්වන්නෙමු.



**දකුණු පස ඇති ගණනය කිරීමේ උදාහරණයේ පෙන්වා ඇති පරිදි, පෙර වසරේ තම ආදායම (ඉපැයුම්) වැඩි වීම අනුව (ඊළඟ වසරේ ජුනි මාසයේ සිට) තම රක්ෂණ වාරිකය වැඩි වේ.**

රක්ෂණ වාරික ගණනය කිරීමේ උදාහරණය (වයස අවුරුදු 40 ට අඩු තනි කුටුම්භ සඳහා නම්)

◆ආදර්ශ පිරික්සුම ① (පෙර වසරේ වැටුප් ආදායම යෙන් මිලියන1.08 කි)

⇒ මසකට **යෙන් 1,600 ක් පමණ**

◆ආදර්ශ පිරික්සුම ② (පෙර වසරේ වැටුප් ආදායම යෙන් මිලියන1.5 කි)

⇒ මසකට **යෙන් 8,500ක් පමණ**

◆ආදර්ශ පිරික්සුම ③ (පෙර වසරේ වැටුප් ආදායම යෙන් මිලියන 2 කි )

⇒ මසකට **යෙන් 14,400 ක් පමණ**

(2) රක්ෂණ වාරික අඩු කිරීම

පෙර වසරේ ඔබේ ආදායම නිශ්චිත මුදලකට වඩා අඩු නම්, ඔබේ රක්ෂණ වාරිකය ස්වයංක්‍රීයව අඩු වේ.

(3) රක්ෂණ වාරික නිදහස් කිරීම

නිදහස් කර ගැනීම සඳහා,

① නිර්ණායක සපුරාලීම අත්‍යාවශ්‍ය වේ.

② තම කොට්ඨාශ කාර්යාලයට (ශාඛා කාර්යාලයට) අයදුම්කිරීම අවශ්‍ය වේ.

◆ නිදහස් කිරීම් ක්‍රමවේදයේ ප්‍රධාන උදාහරණ

・ [ආදායම් අඩුවීම]… පසුගිය වසරට සාපේක්ෂව මෙම වසරේ ආදායම් ප්‍රමාණය සැලකිය යුතු ලෙස අඩු වුවහොත් ආදායම් ප්‍රතිශතයෙන් 30% සිට 70% දක්වා අඩු වේ.



තම ආදායම ඇත්ත වශයෙන්ම සැලකිය යුතු ලෙස අඩු නොවන්නේ නම්, ඊළඟ මුදල් වර්ෂයේ සිට තමාට අමතර රක්ෂණ වාරික ගෙවීමට සිදුවේ.




4 රක්ෂණ වාරික ගෙවීම සම්බන්ධයෙන්

・ රක්ෂණ වාරිකය මාසික වාරික වශයෙන් ගෙවන්න.

・ ගිණුම් මාර්ගයෙන් රක්ෂණ වාරික ගෙවන්න.

・ ගිණුම් මාර්ගික ක්‍රියා පටිපාටි සඳහා මූල්‍ය කාඩ්පතක් අවශ්‍ය වේ, එබැවින් තම මුදල් කාඩ්පත කොට්ඨාශ කාර්යාලයට රැගෙන එන්න.

・ රක්ෂණ වාරික **සෑම මසකම අවසාන දිනයේ** (අවසාන දිනය මූල්‍ය ආයතන සඳහා නිවාඩු දිනයක් නම් ඊළඟ ව්‍යාපාරික දිනයේ) තම ගිණුමෙන් අඩු කරනු ලැබේ.

・ ගිණුමෙන් මුදල් ගණදෙනු ආරම්භ වන තෙක්, ගෙවීම් පත්‍රිකාව මගින්රක්ෂණ වාරිකය ගෙවන්න.

◆ ජාතික සෞඛ්‍ය රක්ෂණ වාරික, බදු ගෙවිය යුතු ආකාරයටම ගෙවීමේ වගකීම ඇත.

◆ ඇතැම් මූල්‍ය ආයතනවල වෙබ් අඩවි මගින්, ගිණුමෙන් මුදල් බැරවීම සඳහා ඉල්ලුම් කළ හැක.




5 රක්ෂණ වාරික ගෙවීම ප්‍රමාද වී ඇති විටක

・ තම සේවා ස්ථානයට (අර්ධ කාලීන රැකියාව) ඇමතුම් දිමද සිදුවිය හැක.

・ අමතර ගෙවීමක් සිදු කිරීම අවශ්‍ය වේ.

・ තම දේපල පවරා ගනු ලැබේ.

**・ තම නේවාසික පදිංචි කාලය අලුත් කිරීමට නොහැකි වන අවස්ථාද ඇතිවිය හැක.**

くわしくはこちら（日本語）→

◆ විමසීම් සඳහා, තම කොට්ඨාශ කාර්යාලයේ සෞඛ්‍ය රක්ෂණ සහ විශ්‍රාම වැටුප් අංශය හෝ තම පදිංචි ශාඛා කාර්යාලයේ සුබසාධන අංශය අමතන්න.